# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 01 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 දෙසැම්බර් මස 01 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.55 යි.

1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 01 වන දින]

එල්. ඩී. — ඕ. 52/95

**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

2. මේ පනත, 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

### ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය පිහිටුවීම

2. (1) මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම ද ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. ආයතනයේ අරමුණු පහත දැක්වෙන පරිදි වන්නේ ය:—

(අ) උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා හා ජාතික ඩිප්ලෝමා පාඨමාලා සහ අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් තාක්ෂණ පාඨමාලා පැවැත්වීම ;

(ආ) තාක්ෂණ අධ්‍යාපන සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන අරමුදල් උසස් තාක්ෂණ ආයතනවලට වෙන් කර දීම සහ ඒ එක් එක් උසස් තාක්ෂණ ආයතනයේ වියදම් පාලනය කිරීම ;

(ඈ) උසස් තාක්ෂණ ආයතනවල ශාස්ත්‍රීය හා පුහුණු කිරීමේ ප්‍රමිති පවත්වා ගැනීම ;

(ඉ) උසස් තාක්ෂණ ආයතනවල පරිපාලනය විධිමත් කිරීම ;

2 — ඩී 068022 — 6, 730 (95/10)

(ඊ) එක් එක් උසස් තාක්ෂණ ආයතනයට සිසුන් ඇතුළත් කර ගැනීම විධිමත් කිරීම;

(උ) මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ ආයතනය වෙත පැවරී ඇති යම් බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය කිරීම.

ආයතනයේ බලතල.

4. ආයතනයට පහත සඳහන් බලතල ඇත්තේ ය:—

(අ) උසස් තාක්ෂණ ආයතන පිහිටුවීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නිර්දේශ කිරීම;

(ආ) උසස් තාක්ෂණ ආයතනවලට අදාළ නීති ප්‍රඥප්ති හා අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරීම;

(ඇ) උසස් තාක්ෂණ ආයතන විසින් අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය, භෞතික හා මිනිස් සම්පත් නිශ්චය කිරීම;

(ඈ) උසස් තාක්ෂණ ආයතනවලට අරමුදල් වෙන් කර දීම, ඒවායේ වියදම් විධිමත් කිරීම සහ අරමුදල් උපයෝජනය සමීක්ෂණය කිරීම;

(ඉ) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව එක් එක් උසස් තාක්ෂණ ආයතනයට ඇතුළත් කර ගැනීම සඳහා සිසුන් තෝරා ගැනීම;

(ඊ) එක් එක් උසස් තාක්ෂණ ආයතනයේ මුදල් අවශ්‍යතා පිළිබඳව කලින් කල විභාග කිරීම හෝ විමර්ශනය කිරීම;

(උ) එක් එක් උසස් තාක්ෂණ ආයතනයේ නඩත්තුව හා සංවර්ධනය අරබයා හෝ වෙනත් යම් පොදු හෝ විශේෂ කාර්යයක් සඳහා, ඒ ඒ ආයතනයේ පාලන සභාව විසින්, ත්‍රෛවාර්ෂික අයවැය ලේඛන කලින් කල සකස් කිරීම;

(ඌ) එක් එක් උසස් තාක්ෂණ ආයතනයට පොදු අරමුදලින් කිරීමට අවශ්‍ය ප්‍රදානවල ස්වභාවය හා ප්‍රමාණය සම්බන්ධයෙන් කලින් කල අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම;

(එ) උසස් තාක්ෂණ ආයතනවල කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටි හා පත් කිරීමේ ක්‍රියාවලිය සකස් කිරීම;

(ඒ) කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම;

(ඔ) උසස් තාක්ෂණ ආයතනවල කාර්ය මණ්ඩලවල විවිධ ශ්‍රේණිවලට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණය සහ කාර්ය මණ්ඩලවලට ලැබිය යුතු වෙනත් ප්‍රතිලාභවල ස්වභාවය හා ප්‍රමාණය, ආණ්ඩුවේ සමස්ත වැටුප් හා වේතන ප්‍රතිපත්ති ඇතුළත නිශ්චය කිරීම ;

(ඕ) ආයතනයේ කටයුතු නිසි පරිදි කාර්යක්ෂම ලෙස කරගෙන යාම සඳහා අවශ්‍ය යයි ආයතනය විසින් සලකනු ලබන යම් නිලධරයන්ගෙන් හා සේවකයන්ගෙන් සමන්විත විය යුතු, ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම ;

(ක) ආයතනයේ කාර්ය මණ්ඩලයේ යහපත අරභයා සුභ සාධන වැඩ සටහන් ඇතිකොට ඒ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ග) යම් උසස් තාක්ෂණ ආයතනයක ශිෂ්‍යයන්ගේ විනය පිළිබඳව, ඒ උසස් තාක්ෂණ ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් ආයතනයේ පාලක සභාව වෙත දැනුම් දෙනු ලබන, යම් කාරණා සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම හෝ පැවැත්වීමට සැලැස්වීම සහ එහි ලා ප්‍රතිකර්ම යෙදීම ;

(ච) එවැනි කාරණාවල දී උසස් තාක්ෂණ ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ තීරණවලින් ඒ කාරණා බලපාන පාර්ශ්වයන් සෑහීමට පත් නොවන අවස්ථාවල දී කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් සඳහා අභියාචන මණ්ඩලයක් ලෙස ක්‍රියා කිරීම ;

(ජ) චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීම සහ දැරීම සහ ඒ දේපළ විකිණීම, බද්දීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම :

එසේ වුවද ආයතනයේ කිසිම නිශ්චල දේපළක්, අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව විකුණනු නොලැබිය යුතු ය.

(ට) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ සහ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම ;

(ඩ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ණ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම ;

(ත) තාක්ෂණ පිරිස්වල හා ආශ්‍රිත වෘත්තිකවේදීන්ගේ අධ්‍යාපනය නංවාලීමේ යම් අංශයක් හා සම්බන්ධ පරීක්ෂණ, සමීක්ෂණ හා විමර්ශන ආරම්භ කිරීම. ප්‍රවර්ධනය කිරීම. පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම ;

(ද) තාක්ෂණ පිරිස්වල හා ආශ්‍රිත වෘත්තික වේදීන්ගේ අධ්‍යාපනය හා සම්බන්ධ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ව්‍යාපෘතියක් හෝ ව්‍යාපෘති සඳහා යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් පිළිගත් ආයතනයට හෝ ආයතනවලට ප්‍රදාන දීම ;

(න) ආයතනයේ කටයුතු කළමනාකරණය සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ප) ආයතනයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ආයතනයේ මතය අනුව අවශ්‍ය වන හෝ හිතකර වන හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

ආයතනයේ ශාස්ත්‍රීය බලතල.

5. 4 වන වගන්තියෙන් ආයතනය වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව ආයතනය විසින්, පහත සඳහන් ශාස්ත්‍රීය බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය :—

(අ) උසස් තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ආ) අදාළ අධ්‍යයන පාඨමාලාවල විෂයමාලා සැලසුම් කිරීම, සමාලෝචනය කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම ;

(ඇ) උසස් තාක්ෂණ අධ්‍යාපන සංවර්ධනයේ යම් අංශයකට අදාළ පර්යේෂණ, සමීක්ෂණ හා විමර්ශන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම ;

(ඈ) ශිෂ්‍යයන්ගේ කාර්ය සාධනය අගැයීම ;

(ඉ) විභාග පවත්වා ශිෂ්‍යයන්ගේ කාර්ය සාධනය තක්සේරු කිරීම ;

(ඊ) තත් කාර්යය සඳහා පනවා ඇති අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමීම ;

(උ) එක් එක් උසස් තාක්ෂණ ආයතනයට වාර්ෂිකව ඇතුළත් කර ගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒ සංඛ්‍යාව විවිධ අධ්‍යයන පාඨමාලාවලට වෙන් කිරීම, ඒ ඒ උසස් තාක්ෂණ ආයතනයේ පාලන අධිකාරිය විමසා, කලින් කල නිශ්චය කිරීම.

6. (1) ආයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් වනු ලබන) ආයතනයේ පාලක සභාව වෙත පවරනු ලැබිය යුතු ය. ආයතනයේ පරිපාලනය සභාව වෙත පවරනු ලැබිය යුතු බව.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා සභාව විසින්, මේ පනතින් ආයතනය වෙත හෝ ආයතනයට පැවරුණු, භාර කෙරුණු හෝ නියම කෙරුණු බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ; ඉටු කරනු ලැබිය යුතු ය.

7. (1) සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :— සභාවේ සංයුතිය.

(අ) නිල බලයෙන් සාමාජිකයන් වන තැනැත්තන්, එනම්—

(i) මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන සභාවේ සභාපතිවරයා විය යුතු, උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ii) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iii) කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ; සහ

(ආ) පහත සඳහන් වෙනත් සාමාජිකයන්, එනම්—

(i) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය පනතින් පිහිටුවනු ලද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ නියෝජිතයෙක් ;

(ii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වෙළෙඳ හා කර්මාන්ත මණ්ඩලවලින් නියෝජිතයෙක් ,

(iii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, 1968 අංක 17 දරන පනතින් පිහිටුවනු ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ නියෝජිතයෙක් ;

(iv) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, පිළිවෙළින් යෞවන කටයුතු, රැකීරක්ෂා සහ ක්‍රීඩා, කර්මාන්ත සංවර්ධන, වෙළෙඳ හා වාණිජ, විද්‍යා, තාක්ෂණ හා මානව සම්පත්, අධ්‍යාපනය, කෘෂිකර්මය, ඉඩම් සහ වන සම්පත් යන විෂය භාර අමාත්‍යවරයන්ගේ අමාත්‍යාංශවලින් නියෝජිතයන් හය දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් ; සහ

(v) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, ආයතනයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල පිළිගත් ප්‍රවීණතාවක් හෝ විශිෂ්ටත්වයක් ලබා ඇති තැනැත්තන් තුන් දෙනෙක්.

(2) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු වේ නම් හෝ පාර්ලිමේන්තු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු වුවහොත් ඒ තැනැත්තා, සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යෑමට නුසුදුස්සෙක් වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන සභාවේ සෑම සාමාජිකයකු ම—

(අ) අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් ; හෝ

(ආ) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඔහු ඉල්ලා අස්වුවහොත්

එවැනි සාමාජිකයකු වශයෙන් ධුරය අත්හළ යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයකු මියගිය හෝ ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක, ඒ මිය ගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකු, ස්වකීය ධුරයෙන් කලින් ඉල්ලා අස්වීම සහ ඉවත කිරීම නිසා ධුරය අත්හැරියහොත් හෝ මියයාම හෝ ඉවත කිරීම නිසා ධුරය අත්හැරියහොත් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයකුට, රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ නිසා, ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සෑම සාමාජිකයකු ම, මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, තමා ඒ ධුරයට පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(7) සභාවේ නිල බලයෙන් පත්වන සෑම සාමාජිකයකු ම, සභාවේ සාමාජිකයකු වශයේ යම් තනතුරක් ප්‍රකාර ද, ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

ආයතනයේ මූලාවි.

8. ආයතනයේ මූලාවි—

(අ) සභාව විසින් කලින් කල නිර්ණය කරන ලබන යම් තැනැත්තන් භාරයේ තිබිය යුතු ය ;

(ආ) සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ; තව ද

(ඇ) සභාවේ අනුමතය ඇතිව මිස සහ තමා පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් යම් ලියවිල්ලකට අත්සන් තැබිය යුතු සභාවේ සාමාජිකයකු ඉදිරියේ දී හැර, ඒ ලියවිල්ලට තබනු නොලැබිය යුතු ය.

9. (1) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැති විටක, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. සභාපතිවරයා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා යන දෙදෙනාම පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දරනු ලැබිය යුතු ය. සභාවේ රැස්වීම්.

(2) සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය, සභාවේ සාමාජිකයන් සත්දෙනාකුට නොඅඩු විය යුතු ය.

(3) සභාවේ යම් රැස්වීමක දී තීරණයකට එළඹිය යුතු සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව සමාන වන විටක, සභාපතිවරයාට හෝ සභාවේ යම් රැස්වීමක මූලාසනය දරන වෙනත් යම් සාමාජිකයකුට තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) (2)වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාව විසින්, එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය, විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(5) සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සභාවේ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක්, සභාවේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

10. (1) ආයතනයෙහි (මෙහි මින් මතු 'කමිටුව' යනුවෙන් සඳහන් කරනු ලබන) ශාස්ත්‍රීය කමිටුවක් විය යුතු ය. ශාස්ත්‍රීය කමිටුව.

(2) කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත් වන පහත සඳහන් තැනැත්තන් එනම්—

(i) කමිටුවේ සභාපතිවරයා විය යුතු, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ii) කමිටුවේ ලේකම්වරයා විය යුතු, ආයතනයේ සැලසුම් හා පර්යේෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iii) ආයතනික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iv) උසස් තාක්ෂණික ආයතනවල අධ්‍යක්ෂවරයන් ; සහ

(ආ) පහත සඳහන් වෙනත් සාමාජිකයෝ, එනම් --

(i) විවිධ අධ්‍යයන අංශ නියෝජනය කිරීම පිණිස සභාව විසින උසස් තාක්ෂණික ආයතනවලින් පත් කරනු ලබන අංශ ප්‍රධානීන් පස්දෙනෙක් ;

(ii) එක් එක් අධ්‍යයන ක්ෂේත්‍රයෙන් සභාව විසින් පත් කරනු ලබන ආචාර්යවරයන් පස්දෙනෙක් ;

(iii) ආයතනයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයක් ලබා ඇති තැනැත්තන් අතුරින්, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, සභාව විසින් පත් කරනු ලබන තැනැත්තන් පස්දෙනෙක්.

(3) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන කමිටුවේ සෑම සාමාජිකයකු ම, ඔහුගේ පත්වීමේ දිනයේ සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාලයක් සඳහා කමිටුවේ සාමාජිකයකු වශයෙන් ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත්කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(4) කමිටුවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

ශාස්ත්‍රීය කමිටුවේ බලතල

11. (1) ආයතනයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ කටයුතු සහ විභාග පිළිබඳ පාලනය සහ සාමාන්‍ය මෙහෙයවීම කමිටුව සතු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, කමිටුව විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(අ) උසස් තාක්ෂණික ආයතනවල අධ්‍යයන අංශවල වාර්තා සලකා බැලීමෙන් පසුව, අධ්‍යයන පාඨමාලා සහ විභාග පිළිබඳව ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම සහ ඒ කෙටුම්පත් අනුමතය සඳහා සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ආ) පරීක්ෂකවරයෙන් වශයෙන් පත් කිරීමට යෝග්‍ය තැනැත්තන්ගේ නම්, සභාවට නිර්දේශ කිරීම ;

(ඇ) උසස් තාක්ෂණික ආයතනවල අධ්‍යයන අංශ විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සලකා බැලීමෙන් පසුව—

(i) ප්‍රතිසංවිධාන යෝජනා ක්‍රම ; සහ

(ii) ඒ ඒ අංශවලට අධ්‍යයන විෂයයන් වෙන් කර දීම පිළිබඳව සභාව වෙත නිර්දේශ කිරීම ;

(ඈ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ය දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය සඳහා ක්‍රම හා කොන්දේසි සභාවට නිර්දේශ කිරීම ;

(ඉ) සභාව විසින් නිර්දේශ කරනු ලැබිය හැකි කොන්දේසි මත අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ය දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම ;

(ඊ) අවශ්‍ය යයි කමිටුව සලකන ස්ථාවර කමිටු යම් සංඛ්‍යාවක් පත් කිරීම සහ විශේෂයෙන්ම සහ එහෙත් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව,—

(i) තොරතුරු සේවා කමිටුව ;

(ii) ඇතුළත් කර ගැනීමේ කමිටුව ;

(iii) පර්යේෂණ කමිටුව ;

(iv) විෂයමාලා හා අගැයීම් කමිටුව ; සහ

(v) නිවාඩු සහ ප්‍රදාන කමිටුව

පත් කිරීම හා ඒ කමිටුවල නිර්ණය විෂයයන් නියම කිරීම, ඒ කමිටුවල වාර්තා සලකා බැලීම සහ ඒ වාර්තා පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ; සහ

(උ) අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා පිළිබඳව සභාවට නිර්දේශ කිරීම.

## II වන කොටස

## ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආදීන් පත් කිරීම.

12. (1) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු වූ ද, ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා විය යුතු වූ ද (මෙහි මින් මතු " අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අමාත්‍යවරයා විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරින්නේ නම් මිස, තමාගේ පත්වීමේ දිනයේ සිට අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුතු ය.

(3) සභාවේ සාමාන්‍ය විධානයට යටත්ව, ආයතනයේ කටයුතු පරිපාලනය සහ ආයතනයේ කාර්ය මණ්ඩලය පාලනය අධ්‍යක්ෂ ජනරාල්වරයා භාරයේ පැවතිය යුතු ය. සභාවේ සියලු ම තීරණ ක්‍රියාවේ යෙදීම සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතු ය.

(4) ආයතනයේ අරමුණු ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමා සලකන ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවේ සැලකිල්ල සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) සභාව විසින් තමා වෙත පවරනු ලබන යම් බලතල හෝ කාර්ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(6) මේ පනතින් හෝ මේ පනත යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක හෝ වෙනත් එවැනි මණ්ඩලයක යම් රැස්වීමක දී පැමිණ සිටීමට, එහි දී කථා කිරීමට සහ ඡන්දය දීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිකම් තිබිය යුතු ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයා —

(අ) තම කාර්ය ඉටු කිරීමෙහි ලා ස්ථිර වශයෙන්ම අශක්නුතාවකට පත්වුවහොත්; හෝ

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව, වංචනික හෝ නීති විරෝධී ස්වභාවයකින් යුත් හෝ ආයතනයේ අරමුණුවලට ප්‍රත්‍යක්ෂ ලෙස විරුද්ධ ක්‍රියාවක් හෝ දෙයක් කරනු ලැබුවහොත්; හෝ

(ඇ) ජාතික ප්‍රතිපත්තියට පටහැනිව ක්‍රියා කළහොත් අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන්නා මිය ගිය විට, (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ තම කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවන ලද ලිපියක් මගින් ඉල්ලා අස් වූ විට, අධ්‍යක්ෂ ජනරාල් ධුරය හිස් වන්නේ ය.

(9) (7) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(10) අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වූ විට, (1) වන උපවගන්තිය යටතේ පත්වීමක් කරනු ලබන තෙක්, අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් සභාවේ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(11) අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ ය.

(12) සභාව විසින් තමා වෙත පවරන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් යම් නිලධරයකුට හෝ ආයතනයේ කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකුට පැවරීම අවශ්‍ය යයි තමා සලකන කවර හෝ විටක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවේ අනුමතය ඇතිව එසේ පවරනු ලැබිය හැකි ය.

13. (1) මේ පනතේ විධිවිධානවලට සහ අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගවලට යටත්ව, ආයතනයේ නිලධරයන් හා සේවකයන් පත් කිරීමට සභාවට බලතල තිබිය යුතු ය. ආයතනයේ කාර්ය මණ්ඩලය.

(2) ආයතනයේ නිලධරයන් හා සේවකයන් ලෙස කරනු ලබන සෑම පත්කිරීමක් ම නියෝග මගින් නියමිත පත්වීම් සඳහා වූ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට සහ පත්කිරීමේ කාර්ය පටිපාටිවලට අනුකූලව සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට සහ අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගවලට යටත්ව, ආයතනයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වැටුප්, වේතන සහ වෙනත් පාරිශ්‍රමික ඇතුළුව, ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියම සහ කොන්දේසි සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) ආයතනයේ නිලධරයන් හා සේවකයන්, පහ කිරීමේ බලය ද ඇතුළුව, සභාවේ විනය පාලනයට යටත් විය යුතු ය. විනය පිළිබඳ කාරණා සම්බන්ධයෙන්, සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(5) සභාව විසින් ආයතනයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථ සාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා, පවත්වා ගෙන යාම ද, එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට සභාව විසින් [illegible]

14. යම් නියමිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟවෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට කරන ලද යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් නිදහස් කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය. ඇතැම් කටයුතුවල කාර්ය සඳහා ආයතනයට කරන ලද සේවය ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**15.** (1) සභාවේ ඉල්ලීම පිට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සේවය කරන රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය සහිතව දෙනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත සහ ඒ නිලධරයාගේ කැමැත්ත ඇතිව, ආයතනය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) සභාවේ ඉල්ලීම පිට, (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයකු නොවන රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ රජයේ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ රජයේ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) සභාවේ ඉල්ලීම පිට, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයක, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනි ම කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

### මුදල්

ආයතනයේ ප්‍රාග්ධනය.

**16.** (1) පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් තත් කාර්යය සඳහා ආයතනය වෙත ප්‍රදානය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, ආයතනයේ ප්‍රාරම්භක ප්‍රාග්ධනය විය යුතු ය.

(2) ආයතනයේ ප්‍රාග්ධනය, යම් විසර්ජන පනතකින් හෝ පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් හෝ බලය දෙනු ලබන යම් මුදල් ප්‍රමාණවලින් කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

17. (1) ආයතනයට ආයතනයේ ම අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදල.

(2) ඒ අරමුදලට —

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) කවර හෝ ප්‍රභවයකින්, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල් සහ ආයතනය විසින් සපයන සේවා සඳහා අය කරනු ලබන ගාස්තු; සහ

(ඇ) මේ පනතින් හෝ මේ පනත යටතේ අරමුදලට ගෙවිය යුතු යයි නියමිත සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) ඒ අරමුදලින්—

(අ) ස්වකීය කටයුතු කරගෙන යාමේ දී ආයතනය විසින් දරන ලද යම් වියදම් හෝ මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

18. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ආයතනයේ මුදල් වර්ෂය.

19. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ගිණුම් විගණනය.

## IV වන කොටස

## උසස් තාක්ෂණ ආයතන පිහිටුවීම

20. (1) අමාත්‍යවරයා විසින්, ආයතනය විමසා, නියමයක් මගින්— උසස් තාක්ෂණ ආයතන පිහිටුවීම.

(අ) තාක්ෂණික පිරිස්වලට හා සහාය වෘත්තිකවේදීන්ට අධ්‍යාපනය ලබාදීමේ, ඔවුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා උසස් තාක්ෂණ ආයතනයක් පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) ඒ ආයතනයට නාමයක් හා අභිධානයක් පවරා දෙනු ලැබිය හැකි ය;

(ඇ) ඒ ආයතනය පිහිටුවන ස්ථානය වශයෙන් යම් ප්‍රදේශයක් හෝ භූමියක් නියම කළ හැකි ය;

(ඈ) යම් අධ්‍යයන අංශයක් හෝ අංශ ඒ ආයතනයට පැවරිය හැකි ය ;

(ඉ) අධ්‍යයන අංශ ප්‍රභේදන නියම කළ හැකි ය ;

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ විට, ඒ නියමයෙන් පවරා දී ඇති නාමයෙන් උසස් තාක්ෂණ ආයතනයක්, ඒ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පැවරීමේ පූර්ණ බලය ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ බලය ද, මේ පනතින් හෝ මේ පනත යටතේ ඒ උසස් තාක්ෂණ ආයතනය වෙත පවරන ලද, නියම කරන ලද හෝ වෙන්කර දෙන ලද බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ බලය ද, ඇතිව ඒ නාමයෙන් හා අභිධානයෙන් පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

උසස් තාක්ෂණ ආයතනයේ බලතල.

21. ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍යවලට යටත්ව, උසස් තාක්ෂණ ආයතනයකට පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) ආයතනයේ නිර්දේශ මත, උසස් තාක්ෂණ ආයතනයට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම්

(ආ) ආයතනය විසින් අනුමත කරන ලද විෂය මාලාවලට අනුකූලව අධ්‍යයන පාඨමාලා පැවැත්වීම ;

(ඇ) අවශ්‍ය සියලු කාරණා සම්බන්ධයෙන්, වෙනත් උසස් තාක්ෂණ ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම ;

(ඈ) කර්මාන්ත සමග සම්බන්ධතා පවත්වා ගෙන යාම ;

(ඉ) ආයතනයේ අනුමතය ඇතිව, ව්‍යාප්ති පාඨමාලා සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ;

(ඊ) ශිල්පශාලා පවත්වා ගෙන යාම ;

(උ) එහි නිලධරයන්ට හා සේවකයන්ට වැටුප් හා වෙනත් යම් වියදම් ගෙවීම ;

(ඌ) එය විසින් පවත්වා ගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලාවල ප්‍රවීණත්වයක් අත් කරගෙන ඇති තැනැත්තන් නිසැකව දැන ගැනීම සඳහා, ආයතනය විසින් නිශ්චිතව නියම කර ඇති පරිදි විභාග පැවැත්වීම සහ ඒ විභාගවල දී සාමාර්ථය ලබන අපේක්ෂකයන්ට ඩිප්ලෝමා හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් සභාවට නිර්දේශ කිරීම ;

(එ) ආයතනයේ කැමැත්ත ඇතිව දේපළ අත්කර ගැනීම ;

(ඒ) ආයතනයේ එකඟත්වය ඇතිව ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඔ) නියෝග මගින් සහ ආයතනයේ අතුරු ව්‍යවස්ථා මගින් කලින් කල නියම කරනු ලැබිය හැකි ගාස්තු ඉල්ලා සිටීම හා ලබා ගැනීම ;

(ඕ) එහි අයවැය ලේඛනය පිළියෙල කිරීම සහ ඒ අයවැය ලේඛනය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ අනුමතය ලබා ගැනීම ;

(ඛ) ආයතනයෙන් ලැබෙන ප්‍රදාන සහ උසස් තාක්ෂණ ආයතනය විසින් උපයා ගනු ලබන යම් ආදායමක් බැර කළ යුතු, ඒ උසස් තාක්ෂණ ආයතනයේ ම අරමුදලක් පවත්වා ගැනීම ;

(ග) ආයතනයේ එකඟත්වය ඇතිව, පුස්තකාල, රසායනාගාර, වැඩ පොළවල්, කාර්යාල, වැඩ බිම්, පන්ති කාමර, විනෝද බිම් හා වෙනත් ගොඩනැගිලි ඉදි කිරීම සහ ඒවාට අවශ්‍ය දෑ සැපයීම,

22. උසස් තාක්ෂණ ආයතනවල නිලධරයන් පහත සඳහන් නිලධරයෝ විය යුතු ය :—

උසස් තාක්ෂණ ආයතනවල නිලධරයෝ.

(අ) ප්‍රධාන විධායක නිලධරයා විය යුතු, අධ්‍යක්ෂවරයා ;

(ආ) උසස් තාක්ෂණ ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වගකිව යුතු, ලේඛකාධිකාරීවරයා ;

(ඇ) ගණකාධිකාරීවරයා :

(ඈ) ප්‍රධාන පුස්තකාලයාධිපති ; සහ

(ඉ) අංශ ප්‍රධානීහු.

## V වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

23. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 128 වන වගන්තියේ විධිවිධාන, ආයතනය කෙරෙහි සහ ආයතනය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඇතැම් විධිවිධාන අදාළ නොවිය යුතු බව.

24. ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව [illegible] ගනු ලැබිය යුතු ය.

ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

25. ආයතනයේ සියලු ම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන්, (දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ සාමාජිකයන් සහ සේවානියුක්තයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

26. (1) (අ) මේ පනත යටතේ ආයතනය විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ ආයතනයේ විධානය මත සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ ආයතනයේ නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන්

මේ පනත යටතේ කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂණය

කරනු ලබන හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) ආයතනය විසින් හෝ ආයතනයට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනය විසින් දරන ලද යම් වියදම් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනයට ගෙවන ලද හෝ ආයතනය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තු ඒ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ ආයතනයේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගනු ලැබුවහොත් මිස, ඒ වියදම්, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) ආයතනයට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී, ආයතනයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කළ නොහැකි විය යුතු ය.

නියෝග.

**27.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සඳහා සහ ඒ කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ සඳහන් කරනු ලබන යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

කරනු ලබන හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) ආයතනය විසින් හෝ ආයතනයට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනය විසින් දරන ලද යම් වියදම් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනයට ගෙවන ලද හෝ ආයතනය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තු ඒ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ ආයතනයේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගනු ලැබුවා හොත් මිස, ඒ වියදම්, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) ආයතනයට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී, ආයතනයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධ හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කළ නොහැකි විය යුතු ය.

නියෝග.

**27.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සඳහා සහ ඒ කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ සඳහන් කරනු ලබන යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.